"TOWARDS A CREDIBLE 2020 GENERAL ELECTION IN SRI LANKA"

# රටේ මැතිවරණ සහ අපේ ඡන්දය




අනුග්‍රහය

UNDEF
The United Nations Democracy Fund
FNUD
Fonds des Nations Unies pour la démocratie

මෙහෙයවීම

පැෆ්රල්

"TOWARDS A CREDIBLE 2020 GENERAL ELECTION IN SRI LANKA"



# රටේ මැතිවරණ සහ අපේ ඡන්දය


**සම්පාදනය**

නීතිඥ ජගත් ලියන ආරච්චි



**පැෆ්රල් ප්‍රකාශනය**

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා
ජනතා ක්‍රියාකාරිත්වය
**(PAFFREL)**

16, බෙයාර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

දුරකථන : (+94) 11 2 558 570 / 11 2 558 571 / 11 2 558 574

ෆැක්ස් : (+94) 11 2 558 572

විද්‍යුත් ලිපිනය : **paffrel@sltnet.lk**

**www.paffrel.lk**

## පැෆ්රල් සංවිධානයේ පණිවුඩය

රාජ්‍යයේ සැබෑ සුජාත හිමිකරුවන් වන්නේ පුරවැසියන්ය. පුරවැසියන් විසින් සාමුහිකව එක්වී තෝරා ගන්නා පුරවැසි නියෝජිතයින්ගෙන් රාජ්‍ය කරවන ආණ්ඩුව නිර්මාණය වේ. එම ආණ්ඩුකරණ ක්‍රියාවලියට පුරවැසියා සම්බන්ධ වන්නේ ඡන්දය නැමති මිල කල නොහැකි අයිතිය උපයෝගි කරගෙනය.

වගකීම් සහිත පුරවැසියන් ලෙස මැතිවරණ යාන්ත්‍රණය පිළිබඳ පුරවැසියන්ගේ අවබෝධය ඉහල තලයක තිබිය යුතුයි යන්න පැෆ්රල් අපගේ මතයයි. මෙම පොත එළිදැක්වීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ද එයමය. ඒ යටතේ පලමුව, රටේ මැතිවරණ යාන්ත්‍රණය පිළිබඳ ඇති පුරවැසියාගේ දැනුම තවදුරටත් වර්ධනය කිරීමටත්, අපේක්ෂකයෙකු තෝරා පත්කර ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳවත් ඡන්ද දායකයාගේ වගකීම් සහ නිවැරදිව ඡන්දය භාවිතා කරන්නේ කෙසේද යන්නත් ඉතා සරළව අවබෝධ කර ගැනීමට පහසු වන ආකාරයට මෙම පොත සකස් කර ඇත.

ආරම්භයේ සිටම ලාංකීය පුරවැසියන්ගේ දේශපාලන අයිතිය සහ ඡන්ද අයිතිය වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් වන අප ඉදිරියටත් ලාංකීය ජන සමාජය සමඟ අත්වැල් බැඳගෙන සිටින්නෙමු. ශ්‍රී ලංකාව තුළ යහපත් දේශපාලන සංස්කෘතියක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කරගත් සියළු දෙනාහට මේ පොත උපහාරයක් වේවා යන්න මාගේ පැතුමයි.

**රෝහණ හෙට්ටිආරච්චි**
**විධායක අධ්‍යක්ෂක**

## අන්තර්ගතය

1. පුරවැසියාගේ රාජ්‍යය.................................. 01

2. ඡන්දය අපේ අනාගතය තීරණය කරයි....... 04

3. මැතිවරණ යාන්ත්‍රණය................................ 08

4. අපේ අපේක්ෂකයා?.................................... 12

5. ඡන්ද දායකයා........................................... 18

6. නිවැරදිව ඡන්දය දීම................................ 22


7. අපිත් එක්ක එකතු වෙමුද.......................... 27

# 1. පුරවැසියාගේ රාජ්‍යය

පුරවැසියන් සහ රාජ්‍යය අතර තිබෙන සබඳතාව, පුරවැසියන්ගේ සහ රාජ්‍යයන්ගේ වගකීම් සහ යුතුකම් පිලිබඳව මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කරනු ලබයි.

## 1.1. රාජ්‍යයක අයිතිකරුවෝ

නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අයිතිය පවතින්නේ ජනතාව සතුව යැයි පිලිගැනීමක් පවතී. රාජ්‍යයේ  ඉහලම අයිතිය හෙවත් පරම අයිතිය ජනතාව සතුව පවතින්නේ යැයි යන අදහසින් ජනතා පරමාධිපත්‍යය යන සංකල්පය බිහි වී ඇත.ජනතාවට රාජ්‍යයක අයිතිය පවතින්නේ යැයි සාමාන්‍යයෙක් පැවසුවද, සැබවින්ම රාජ්‍යයක අයිතිය පවතින්නේ පුරවැසියන්ටය.



පුරවැසියන් යනුවෙන් හඳුන්වන්නේ රාජ්‍යයක් විසින් තමන්ගේ රාජ්‍යයට අයත් ජනතාව ලෙස පිලිගත් ජනතාවය. ඒ අනුව විදේශිකයන් සහ එම රටේ පුරවැසිභාවය හිමි නොවන පුද්ගලයන් ට අදාල රාජ්‍යයේ පරමාධිපත්‍යය අයිතිය පූර්ණ වශයෙන් නොමැත.

## 1.2. පරමාධිපත්‍යය

ඉහත කී ආකාරයට රාජ්‍යයකට පවතින හිමිකාරත්වය පිලිබඳ සංකල්පය පරමාධිපත්‍ය  ලෙස සලකනු ලැබේ. නූතන ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයන් ජනතාවට හිමි බැවින් එයට ජනතා පරමාධිපත්‍යය යැයි කියනු ලැබේ. ජනතා පරමාධිපත්‍යය මූලික කොටස් 3කි.

1. පාලන බලතල        2 .ඡන්ද බලය        3. මානව හිමිකම්




පාලන බලතල යනු රාජ්‍යයක් මෙහෙයවීමේ බලයයි. රාජ්‍යයක් පාලනය කිරීමේ අංශ 3ක් ඇත.

එනම් විධායක ව්‍යවස්ථාදායක සහ අධිකරණ වශයෙනි. ඡන්දය බලය යනු පාලනය සඳහා තමන් කැමති පුද්ගලයන් තෝරා ගැනමේ බලයයි. මානව හිමිකම් යනු පාලන බලතල භාවිතා කරන්නන් විසින් සිදුකරනු ලබන අසාධාරණයන්ට එරෙහිවීමට පුරවැසියන්ට පවතින නීතිමය රැකවරණයයි. ඊ් අනුව පරමාධිපත්‍යය කොටස් 3කින් යුක්තවූ බව සඳහන් කලද සැබවින්ම එහි අංග 5ක් ඇති බව පැහැදිලිය. එනම් විධායක ව්‍යවස්ථාදායක අධිකරණ ඡන්ද බලය සහ මානව හිමිකම් වේ.

## 1.3. ජනතාවගේ පරම අයිතිය ක්‍රියාත්මක වන ආකාරය


පාලන බලතල - ජනාතවගේ පරමාධිපත්‍යයේ ප්‍රධාන කොටස වන පාලන බලතල සැබවින්ම ජනතාව විසින් ක්‍රියාවට නගන්නේ නැත. පාලන බලතල වල එක් අංගයක් වන ව්‍යවස්ථාදායක බලය එනම් නීති සෑදීමේ බලය ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනාතව විසින් තෝරාපත්කරගත් මහජන නියෝජිතයන් (පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්) මගිනි.

පාලන බලතල වල විධායක බලය ක්‍රියාවට නගනු ලබන්නේ මහජන නියෝජිතයන්ගෙන් සහ ජනතාව විසින් වැටුප්ගෙවනු ලබන නිලධාරීන් විසිනි.

පාලන බලතල වල අනෙක් අංගය වන අධිකරණ බලය ක්‍රියාවට නගන්නේ ස්වාධීන අධිකරණයක් විසිනි.

නමුත් පරමාධිපත්‍යයේ අංගයක් වන ඡන්ද බලය පුරවැසියන් විසින් සෘජුවම භාවිතා කරමින් ව්‍යවස්ථාදායක සහ විධායකය සදහා අවශ්‍යවන ජනතා නියෝජිතයින් පත් කර ගනියි. එසේම මානව හිමිකම්ද ජනතාව විසින් සෘජුවම භාවිතා කරයි.

# 2. ඡන්දය අපේ අනාගතය තීරණය කරයි



ඡන්දය මගින් ජනතා පරමාධිපත්‍යය ක්‍රියාවට නගන ආකාරය විස්තර කිරීම සහ ඡන්දය භාවිතා කිරීම සෑම පුරවැසියකුගේම වගකීමක් බව අවධාරණය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.එසේම එක් එක් මැතිවරණ වලදී මහජන නියෝජිතයාගේ භූමිකාවන් විස්තර කරයි,

## 2.1. ඡන්දය සහ රාජ්‍යය

රාජ්‍යයක පරමාධිපත්‍යය පවතින්නේ ජනතාව තුල බව අප ඉහත පරිච්ඡේදයෙන් අවබෝධකර ගතිමු. එසේම පරමාධිපත්‍යයේ ප්‍රධාන අංගයක් වන පාලන බලතල ක්‍රියාත්මක කරන්නේ සෘජුවම ජනතාව විසින් නොවන බවද අවබෝධකර ගත්තෙමු. පාලන බලතල ක්‍රියාවට නගන්නේ ජනතාවගේ ඡන්දයෙන් පත්වන නියෝජිතයින් සහ ඔවුන් විසින් පත්කරන නිලධාරී මණ්ඩලයක් විසිනි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ඡන්දය යනු ජනතාවට පාලන බලතල සඳහා සිය නියෝජිතයින් තෝරාගැනීමට ලැබෙන අවස්ථාවයි. එසේම එය පාලන බලතල සඳහා ජනතාවගේ බලපෑම පෙන්වීමට ලැබෙන අවස්ථාවක් ලෙසද සැලකිය හැකිය.

## 2.2. ඡන්දය සහ ප්‍රජාතන්ත්‍රවාදය

ජනතාව විසින් ජනතාව උදෙසා ජනතා සහභාගීත්වයෙන් පවත්වන පාලනය ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ලෙස හදුන්වයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකදී ජනතාවගේ අවශ්‍යතා මත පදනම්ව රාජ්‍යයක් පාලනය කිරීම සිදුවේ. ජනතාවගේ අවශ්‍යතා සහ කැමැත්ත හදුනා ගැනීම සදහා භාවිතා කරන ප්‍රධානතම මෙවලම වනුයේ මැතිවරණයන්ය. එබැවින් නිසි කලට පවත්වන නිදහස් සහ සාධාරණ මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන අංගයක් වේ.

## 2.3. ශ්‍රී ලංකාවේ මැතිවරණ

ශ්‍රී ලංකාවේ ප්‍රධාන මැතිවරණ 4ක් පවතී, එනම්


- ජනාධිපතිවරණ
- පාර්ලිමේන්තු මහ මැතිවරණ
- පළාත් සභා ඡන්ද විමසීම්
- පළාත් පාලන ඡන්ද විමසීම්
- ජනමත විචාරණ

මේ අතරින් ජනමත විචාරණය හැර අනෙක් සියලුම මැතිවරණ පවත්වනු ලබන්නේ මහජන නියෝජිතයින් තෝරා ගැනීම සදහාය. මෙසේ තෝරාගන්නා ලද මහජන නියෝජිතයින්ගෙන් අපේක්ෂා කරනු භූමිකාවන් එකිනෙකට වෙනස් වේ.

## 2.4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ භූමිකාව

පාර්ලිමේන්තුවේ කාර්යයන් 3ක් ඇත. එනම් නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනයයි. එසේම විධායකයේ ප්‍රධාන ආයතනය වන අමාත්‍ය මණ්ඩලය සදහා සාමාජිකයින් පත්වන්නේද පාර්ලිමේන්තුව තුලිනි. එසේම පාර්ලිමේන්තුව යනු ජාතික ආයතනයකි. එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරාපත්කරන අපේක්ෂකයා නීති සම්පාදනයට, රාජ්‍ය මූල්‍ය පාලනයට සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට හැකියාවක් සහ දැක්මත් ඇති පුද්ගලයකු විය යුතුය. එසේම

පාර්ලිමේන්තුව ජාතික ආයතනයක් නිසා ජාතික අවශ්‍යතා පිලිබඳව අවබෝධයක් සහ සංවේදීතාවක් සහිත පුද්ගලයකු විය යුතුය.




## 2.5. පළාත් සභා මන්ත්‍රිවරයාගේ භූමිකාව

පළාත් සභාවේ විෂය පථයට ගැනෙන විෂයන් සම්බන්ධව ප්‍රඥප්ති සම්පාදනය, පලාත් සභාවේ අරමුදල් පාලනය සහ පළාත තුල සංවර්ධනය සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම්වලට අනුකූලව සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පළාත් සභාවක කාර්යයි. එබැවින් පළාත් සභාවට තෝරාපත් කරනු ලබන අපේක්ෂකයා එම කාර්යයන් පිලිබඳව හැකියාවක් සහ දැක්මක් ඇති අයෙකු විය යුතුය. එසේම ජාතික ආයතන සමග තම පළාත් සභාව වෙනුවෙන් නිර්භයව කේවල් කිරීමේ හැකියාවක් ඔහුට/ඇයට තිබිය යුතුය. එවැනි අවස්ථාවන්හිදී තම දේශපාලන පක්ෂයේ වුවද ජාතික දේශපාලනයේ නියුතු අමාත්‍යවරුන් සමග සටහන් කිරීමට සූදානම් විය යුතුය. පළාතේ ජන ජීවිතය සහ සම්පත් හා ස්භාවික තත්වයන් පිලිබඳව හොද අවබෝධයක් ඇති අයෙකු විය යුතුය.

## 2.6. පළාත්පාලන සභිකයාගේ භූමිකාව

පළාත්පාලන ආයතනයන් වන මහ  නගර සභා, නගර සභා, සහ ප්‍රාදේශිය සභාවල අරමුණ වන්නේ ප්‍රාදේශීය සංවර්ධනයයි. ඒ සදහා අවශ්‍ය වන අනු නීති සකස් කිරීම, සංවර්ධන සැලසුම් සකස් කිරීම, අයවැය සම්පාදනය, මහජන උපයෝගිතා සේවාවන් පවත්වාගෙන යාම, මහජන සෞඛ්‍ය ආරක්ෂාව ආදිය පළාත් පාලන ආයතනයක ප්‍රමුඛ කාර්යයන් වේ. එබැවින් පළාත් පාලන ආයතනයක සභිකයකුට අදාල බල ප්‍රදේශය පිලිබද හොඳ දැනීමක් මෙන්ම මනා මහජන සබඳතාවක්ද පැවතිය යුතුය. ඔහු ජනතාව සමග නිරන්තරයෙන්ම සම්බන්ධ පුද්ගලයකු විය යුතුය.


## 2.6. මහජන නියෝජිත භූමිකාව අවබෝධ කරගනිමු

ශ්‍රී ලංකාවේ පවතින පාලන මට්ටම් තුනෙහි මහජන නියෝජිතයින්ගේ කාර්යය භාරයන් සහ වගකීම් එකිනෙකට වෙනස් බව ඉහත කී කරුණු වලින් පැහැදිලි වේ. එබැවින් මැතිවරණයකදී අපේක්ෂකයකුට මනාපය ප්‍රකාශ කිරීමේදී අදාල කාර්යය භාරය ඉටුකිරීමට වඩාත් සුදුසු අපෙක්ෂකයා තෝරාගත යුතුය. එහිදී හුදෙක් කථිකත්වය, කඩවසම් බව, දේශපාලන ඥාති සබදතාව, ධනය, වියදම් කිරීමේ හැකියාව, මරණ ගෙවල් සහ මගුල් ගෙවල්වට සහභාගී වූ ප්‍රමාණය, ආධාරකරුවන් වෙනුවෙන් පෙනී සිටීම් ආදී කරුණුවලට වඩා අදාල මහජන නියෝජිතයාගෙන් සැබවින්ම අපේක්ෂා කරන භූමිකාවට අදාල කටයුතු ඉටුකිරීමට ඔහු/ඇය කෙතරම් ශක්තතාවක් දක්වයිද යන්න සිතා බැලීම රටේ අනාගතය සදහා ඉතා වැදගත්ය.

මේ අනුව ඡන්දය භාවිතා කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අත්‍යවශ්‍ය අංගයක් මෙන්ම එය ජනතා පරමාධිපත්‍ය මෙන්ම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයද ප්‍රායෝගිකව ක්‍රියාවට නගන මහගු ක්‍රියාවක් බව අවධාරණය කල යුතුය. එසේම එම තම ඡන්දය සහ මනාපය ලබාදීමේදී මහජන නියෝජිතයාගෙන් අපේක්ෂා කරන භූමිකාව නිවැරදිව අවබෝධකරගෙන ඒ සදහා සුදුසු අපේක්ෂකයකු පත් කර යැවීම ඡන්ද දායක වගකීමක්ද වේ.

# 3. මැතිවරණ යාන්ත්‍රණය

මැතිවරණය පැවැත්වීමට අදාල පාලන යාන්ත්‍රණය සහ මැතිවරණයකදී ඡන්දය ලබාදීමට අවශ්‍යවන ඡන්ද නාමලේඛණ ක්‍රියාවලිය පිලිබදව මෙම පරිච්ඡේදයෙන් විස්තර වේ.



ශ්‍රී ලංකාවේ මැතිවරණ කැලැන්ඩර් ක්‍රමයක් නොමැති අතර මැතිවරණය පැවැත්වීමේ කාලය සහ දින තීරණය කිරීමේ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ඒ ඒ මැතිවරණ පනත්වල සදහන් වේ. කෙසේ නමුත් මැතිවරණයකදී ඡන්දය ලබාදීම සදහා පුරවැසියන්ට අවස්ථාව සැලසීමේ ක්‍රියාවලිය වාර්ෂිකව අඛණ්ඩව සිදුකිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. එකී ක්‍රියාවලියේ මූලික අංගපහත පරිදී විසිතර කල හැකිය.

## 3.1. ඡන්ද නාම ලේඛණය

වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ට ඡන්ද අයිතිය ඇති නමුත් මැතිවරණයකදී  ඡන්දය භාවිතා කිරිමට නම් අදාල වර්ෂයේ ඡන්ද නාමලේඛණයේ සිය නම ඇතුලත්ව තිබිය යුතුය.




ඡන්ද නාමලේඛණ සෑම වර්ෂයකම යාවත් කාලීන කරනු ලබයි. එය සෑම වර්ෂයකම මැයි මාසයේදී ආරම්භවේ. සැප්තැම්බර් මාසයේදී ඡන්ද නාමලේඛණ විරෝධතා සදහා ග්‍රාම නිලධාරී කාර්යයාල වලද මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේද ප්‍රදර්ශණය කරනු ලබයි. තම න මචම ඡන්ද නාමලේඛණය තුල නොමැති නම් ඒ සදහා අභියාචනා කිරීමක් යම් නුසුදුසු ඡන්ද දායකයකුගේ නම ඇතුලත්වී තිබේනම් හෝ වැරදි ලෙස ඡන්ද නාමලේඛණයකට නමක් ඇතුලත් කර තිබේ නම් ඒසදහා විරුද්ධ වීමට සියලු දෙනාට අයිතියක් ඇත. විරෝධතා දැක්වීමේ අවසන් දිනය දෙසැම්බර් මාසයේද සිදුකරනු ලබයි.

## 3.2. ඡන්දය දැනුම්දීම

මැතිවරණය පවත්වන දිනය නිවේදනය කිරීම ජනාධිපති /මැතිවරණ කොමිෂන් සභාවේ වගකීමකි. නමුත් මැතිවරණයක් නිවේදනය කල පමණින් සැමදෙනාටම ඡන්දය භාවිතා කිරීමට අයිතිය ලැබෙන්නේ නැත. ඡන්දය භාවිතා කල යුතු දිනයද අදාල ඡන්ද මධ්‍යස්ථානයද නම් කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද දායකයන්ට නිවේදනයක් එවනු ලබයි. එය "**නිළ ඡන්ද නිවේදනය**" ලෙස හඳුන්වනු ලැබේ. නිල ඡන්ද නිවේදනයක් ලැබෙනුයේ අදාල වර්ෂයේ ඡන්ද නාමලේඛණයේ නම සදහන් තැනැත්තන්ට පමණි.

## 3.3. මැතිවරණය පැවැත්වීම

මැතිවරණයක් පැවැත්වීමේ බලය පවතින්නේ මැතිවරණ කොමිෂන් සභාවටය. එසේම මැතිවරණයට අදාලව ඡන්ද නාමලේඛණ යාවත්කාලීන කිරීමද මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයකි. මැතිවරණ කොමිෂන් සභාව සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුතු ආයතනයක් වන අතර ඒ යටතේ මැතිවරණ මහ ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වේ. එසේම සෑම දිස්ත්‍රික්කයකම මැතිවරණ දිස්ත්‍රික් මැතිවරණ කාර්යයාලයක් පවතින අතර එකී කාර්යයාල මගින් දිස්ත්‍රික්කය තුල මැතිවරණ සහ ඡන්ද නාමලේඛණ කටයුතු මෙහෙයවනු ලබයි.

## 3.4. පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රියාවලියේ විවිධ මට්ටම් සහ නිලධාරීන්

| | |
|---|---|
| **ජාතික මට්ටම** | ◈ මැතිවරණ කොමිෂන් සභාව<br>◈ කොමසාරිස් ජෙනරාල්<br>◈ ලේකම් |
| | **මැතිවරණ මහලේකම් කාර්යාලය**<br>◈ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු මැතිවරණ)<br>◈ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් |
| **දිස්ත්‍රික් මට්ටම** | ◈ තේරීම්භාර නිලධාරී |
| | ◈ සහකාර තේරීම්භාර නිලධාරී (සහකාර මැතිවරණ කොමසාරිස්) |
| **කලාප මට්ටම** | ◈ සහකාර තේරීම්භාර නිලධාරී |
| **ඡන්ද මධ්‍යස්ථාන මට්ටම** | ◈ ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිළධාරී |
| | ◈ කණිෂ්ඨ ඡන්දපොල නිළධාරී |
| | ◈ ඡන්දපොල නිළධාරීන් |
| | ◈ ග්‍රාම නිළධාරී |

# 4. අපේ අපේක්ෂකයා



මැතිවරණයක් පවත්වන්නේ අපේක්ෂකයන් අතරින් පිරිසක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තෝරාපත් කර ගැනීම සඳහාය. එබැවින් මැතිවරණයකදී අපේක්ෂකයන් අනිවාර්ය පාර්ශවයකි. අපේක්ෂකයන්ගේ සුදුසුකම් නුසුදුසුකම් වගකීම් සහ අපේක්ෂකයකු තෝරාගැනීමේදී ඡන්ද දායකයන් විසින් සැලකිය යුතු කරුණු මෙම පරිච්ඡේදයෙන් විස්තර වේ.

## 4.1. අපේක්ෂකයකුගේ සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
- වයස අවුරුදු 18 සම්පූර්ණකර තිබීම

## 4.2. අපේක්ෂකයකුගේ නුසුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවන තැනැත්තෙක්
- වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙක්

- අධිකරණ නිලධරයකු
- සන්නද්ධ හමුදාවල සාමාජිකයකු
- පොලිස් නිලධාරියකු
- ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක රජයේ නිලධාරියකු
- යම් රාජ්‍ය සංස්ථාවක නිලධාරියකු
- සිහි විකල් පුද්ගලයකු
- වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු
- විදේශයක පුරවැසිභාවය ලබාඇති පුද්ගයකු

ඉහත සදහන් රාජ්‍ය නිළධාරීන් අතරින් දේශපාලන හිමිකම් නොමැති නිළධාරියකු මැතිවරණයකදී අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් නාම යෝජනා භාරදීමට දින 7කට පෙර සේවයෙන් ඉල්ලා අස්වීම හෝ සේවයෙන් විශ්‍රාම ගැනීම කල යුතුය. එසේම දේශපාලන අයිතිවාසිකම් හිමි නිළධාරියකු අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් නාමයෝජනා භාරදීමට දින 10කට පෙර වැටුප් රහිත නිවාඩු ලබාගත යුතුය.

## 4.3. අපේක්ෂකයකුගේ වගකීම්

මැතිවරණයක අපේක්ෂකභාවය යනු වගකීමකි. එය මැතිවරණ ජනග්‍රහණයකට පමණක් සීමා වන්නේ නැත. අපේක්ෂකයකුට පවතින මූලික නෛතික වගකීමක් වන්නේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ සිය වත්කම් සහ බැරකම් මැතිවරණ කොමිසම වෙත ලබාදීමයි. එසේම මැතිවරණ නීතිරීතිවලට අනුකූල ලෙස ප්‍රචාරක කටයුතු පවත්වාගෙන යාමත් අපේක්ෂකයකුගේ වගකීමකි. රාජ්‍ය දේපළ භාවිතා කරමින් තම ප්‍රචාරක කටයුතු සදහා යොදා නොගැනීමද තවත් වගකීමකි.
සියල්ල අවසානයේදී මැතිවරණය ජයග්‍රහනය කිරීමෙන් පසුව තම ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමත් තමන් පත්වූ මහජන සභාවට පැවරී ඇති වගකීම් ඉටුකිරීමට කටයුතු කිරීම මෙන්ම ඥාති සංග්‍රහ මිත්‍ර සංග්‍රහ හෝ කල්ලිවාද වලින් තොරව කටයුතු කිරීමද වගකීමකි.

## 4.4. අපේක්ෂකයකු පිලිබද මාර්තු 12 නිර්ණායක

මැතිවරණයකදී මනාප ලබාදීම සදහා අපේක්ෂකයකු තෝරාගැනීම සදහා අපේක්ෂයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම් පිලිබද නිර්ණායක කිහිපයක් මාර්තු 12 ව්‍යපාරය විසින් හදුන්වා දී තිබේ. ඒ අනුව නායෝජනා ලබාදී තිබේද නැද්ද යන්න පිළිබදවද ඔබට අපේක්ෂක ලැයිස්තු පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගත හැකිය.




## 4.5. මාර්තු 12 නිර්ණයාක වලට අනුව යහපත් අපේක්ෂකයකුගේ ලක්ෂණ වන්නේ

- සමස්ථ ජන ප්‍රජාවට සංවේදී, ගෝලීය දැක්මක් සහ දේශිය චින්තනයක් ඇති නීති හා ප්‍රතිපත්ති සම්පාදනයට සහ මූල්‍ය කළමනාකරණයට හැකියාව ඇති ප්‍රායෝගික පුද්ගලයෙකු වීම.
- අපරාධ වරදක් සඳහා සිරදඬුවමකට ලක්වූ හෝ අත්හිටවූ සිරදඬුවම්වලට ලක්වූවකු නොවිය යුතුයි.

- අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරදකරුවෙකු නොවූ සමාජය පිළිගත් චරිතවත් අයෙකු විය යුතුයි. එමෙන්ම අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා ලැබූ අය ගැන පරීක්ෂාකාරී විය යුතුයි.
- මද්‍යසාර, මත්ද්‍රව්‍ය, සූදු, කැසිනෝ, ගණිකා මඩම් ඇතුළු රටේ යහ පැවැත්මට හානිකර ව්‍යාපාර පවත්වාගෙන යන හෝ අතීතයේ එසේ නොකළ අයෙකු විය වීම.
- ජීව ආධාරක ව්‍යූහය විනාශ කරන පාරිසරික වශයෙන් හානිදායක වන ව්‍යාපාරවල යෙදුණු හෝ යෙදෙන අයෙකු නොවීම.
- මහජන නියෝජිතයෙකු වන්නට පෙර රටට අගතිගාමී මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් සහ මහජන නියෝජිතයෙකුව සිටිමින් තම දේශපාලන බලය අයුතු ලෙස භාවිත කර රජය සමග මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් හෝ ගිවිසුමක පාර්ශ්වකරුවෙකු නොවන්නෙකු වීම.

## 4.6. කාන්තා අපේක්ෂකයන්ගේ වැදගත්කම



ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය 52% ක් වුවද පාර්ලිමේන්තුවේ සහ පළාත් සභාව තුල කාන්තා නියෝජනය ඉතාමත් අවම මට්ටමක පවතී. එබැවින් පාර්ලිමේන්තුව තුල කාන්තා නියෝජනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මේ සදහා වඩාත් උචිත ක්‍රමය වන්නේ දේශපාලන පක්ෂ සහ ස්වාධින කණ්ඩායම් විසින් සාධාරණ ප්‍රතිශතයක් කාන්තාවන් සිය නාමයෝජනා ලැයිස්තු තුලට ඇතුලත් කර ගැනීමයි. නමුත් අවසාන වශයෙන් කාන්තාවන් දිස්ත්‍රික් නාමයෝජනා ලැයිස්තු තුල සිටින අපේක්ෂකයන් /අපේක්ෂිකාවන් පාර්ලිමේන්තුවට පත් කර යැවීමේ අයිතිය සහ හැකියාව ඇත්තේ ඡන්දදායකයන්ටය.

## 4.7. තරුණ සහභාගීත්වයේ වැදගත් කම



ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනයට අදාලව මහජන නියෝජිතයින්ගේ ප්‍රතිශතය ඉතාමත් අල්පය. තරුණ තරුණියන්ට දේශපාලන පක්ෂමගින් සහ ස්වාධින කණ්ඩායම් මගින් නාමයෝජනා ලැබීමේ අවස්ථාවන්ද ඉතාමත් අල්පය. කෙසේ නමුත් තරුණ නියෝනය වර්ධනය කිරීම පිලිබදව වගකීම දේශපාලන පක්ෂ සහ ස්වාධින කණ්ඩායම්වලට මෙන්ම නාමයෝජනා ලැයිස්තුව තුල සිටින තරුණ අපේක්ෂකයන්ට මනාපය ලබාදීම මගින් ඡන්දදායකයන්ටද සිදුකල හැකි බව සිහිතබා ගැනීම වැදගත්ය.

## 4.7. මැතිවරණයට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයින්ට ලකුණු දීම

ඡන්ද විමසීමේ දිනයේදී තමන් ඡන්දය දෙන්නේ කාටද යන්න පිළිබඳ සාධාරණ තීරණයකට එලඹීම සඳහා මාර්තු 12 ව්‍යාපාරය විසින් හදුන්වාදී ඇති **"ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු - ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු"** නැමති ලකුණු සටහන අදාල කරගත හැකිය.

එයට අමතරම මෙම මැතිවරණය පාර්ලිමේන්තු මැතිවරණයක් බැවින් පාර්ලිමේන්තුවේ භූමිකාව වන නීති සම්පාදනය. රාජ්‍ය මූල්‍ය පාලනය. සහ ප්‍රතිපත්ති සම්පාදනයට හැකියාවක් සහ කුශලතාවක් අදාල අපේක්ෂකයන් තුල පවතින්නේදැයි සැලකිලිමත් වන්න.

**ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු, ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු.**

| දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම | ඔබේ දිස්ත්‍රික්කයට තරඟ කරන අපේක්ෂකයන් | ජනතාවගේ අවශ්‍යතා පිළිබඳ සංවේදී පුද්ගලයෙකි | සාධාරණ ලෙස මුදල් වැයකරන්නෙකි | බලය අයුතු ලෙස භාවිතා නොකරන්නෙකි | අල්ලස් හෝ දූෂණ චෝදනා නොලැබූ අයෙකි | රටේ නීති, ප්‍රතිපත්ති සම්පාදනයට දැනුම ඇති අයෙකි | සොබාදහමට හානි නොකරන්නෙකි | රට ගොඩනැගීමට වැඩ පිළිවෙළක් ඇත්තෙකි | ජාති, ආගම් සංස්කෘතික වෙනස්කම් ඉවසන්නෙකි | ක්‍රියාශීලී සහ කාර්යක්ෂම අයෙකි | ජනතාවට අනුකම්පාව දක්වන්නෙකි | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

එක් එක් ශීර්ෂය යටතේ අපේක්ෂකයෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 10කි.

එක් එක් අපේක්ෂකයාට අදාළ මුළු ලකුණු එකතුකර වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගන්න

බුද්ධිමත්ව ඡන්දය භාවිතා කරමු. සුදුස්සන් පමණක් පාර්ලිමේන්තුවට තෝරා ගනිමු.

**මාර්තු 12 ව්‍යාපාරයේ පණිවුඩයකි**

**පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පමණි. සම්පූර්ණ කරන ලද පත්‍රිකා අන් සතු නොකරන්න.**

# 5. ඡන්දදායකයා

මැතිවරණයකදී ඉතාමත් වැදගත් පාර්ශවය වන්නේ ඡන්ද දායකයාය. ඡන්ද දායකයන් නොමැති නම් මැතිවරණයක්ද නොමැත. ඡන්ද දායකයන්ගේ සුදුසුකම් නුසුදුසුකම් සහ ඡන්ද දායක වගකීම් පිලිබදව මෙම පරිච්ඡේදයේ විස්තර කරයි.



## 5.1. ඡන්දදායකයකුගේ සුදුසුකම්

- වයස අවුරුදු 18 සම්පූරණ කර තිබීම
- මැතිවරණයට අදාල වර්ෂයේ ඡන්ද නාමලේඛණයට සිය නම ඇතුලත්ව තිබිය යුතුය.

## 5.2. ඡන්දදායකුගේ නුසුදුසුකම්

- සිහිවිකල තැනැත්තකු ලෙස අධිකරණයක් මගින් තීරණයකර තිබීම,
- මැතිවරණ දූෂණ වරදකට වරදකරු වී ඇත්නම් වරදකරුලෙස තීරණයකල දින සිට වසර 7ක් ඉක්මවා නොතිවීම,
- අල්ලස් පනත යටතේ වු වරදකට වරදකරු වී නම් වරදකරු කල දින සිට වසර 7 ක් ඉක්මවා නොතිබීම,
- මැතිවරණ පනත යටතේ වු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වී එහෙත් එහෙත් වරදකරු වීමේ දිනයේ සිට වර්ෂ 3ක් ඉක්මවා නොතිබීම,
- ප්‍රජා අයිතිය අහෝසිකල පුද්ගලයකු එකී කාලය ඉක්මගොස් නොමැති වීම,
- දණ්ඩ නීති සංග්‍රහය යටත් වු බරපතල වරදකට වරදකරු වී ඇතිවිටක වරදකරු ලෙස තිරණය කල දින සිට වර්ෂ 7ක් ඉක්මවා නොමැති වීම,
- ජනාධිපති කොමිෂන් සභාවක් විසින් එයට අගෞරව කිරීමේ වරදකට වරදකරු කල පුද්ගලයකු එසේ වරදකරු ලෙස තීරණය කල දින සිට වර්ෂ 7 ක් ඉක්මවා නොමැති වීම,

## 5.3. ඡන්දදායක වගකීම්

ඔබේ අතට නිලඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ලැබී ඇත්නම් එහි අදහස ඔබ ඡන්දදායකයකු ලෙස සුදුසුකම් ලබා ඇති බවයි. ඉහත කී නුසුදුසුකම්වලින් මිදී අදාල මැතිවරණයේදී ඡන්දය භාවිතා කිරීමට සුදුසුකම් ලබාඇති බවයි.

එසේම ඔබ පුරවැසියකුද වන බව අමතක නොකල යුතුය. පුරවැසියකු ලෙස හිමිවන ජනතා පරමාධිපත්‍යයේ ප්‍රධාන හිමිකමක් වන්නේ ඡන්ද බලයයි එබැවින් ඡන්ද දායකයන්ගේ පළමු වගකීම වන්නේ ඡන්දය භාවිතා කිරීමයි.

එසේම ඡන්දය භාවිතා කිරීමේදී මැතිවරණයට ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් අතරින් නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩාත් සුදුසු දේශපාලන පක්ෂයට/ස්වාධීන කණ්ඩායමට ඡන්දය ලබාදීමට ඡන්දදායක වගකීමකි.



ඡන්දය ලබාදීමෙන් අනතුරුය මනාපය /මනාප ලබාදීමේදීද නීති සම්පාදනයට, මූල්‍ය පාලනයට සහ ප්‍රතිපත්ති සම්පාදනයට සුදුසුකම් ඇති සහ ඉහත පරිච්ඡේදයන්හි විස්තර කරන ලද නිර්ණායක අනුව තෝරාගත් අපේක්ෂකයා/අපේක්ෂකයන්ට මනාප ලකුණු කිරීමද ඡන්දදායක වගකීමකි.

## 5.4. මැතිවරණයෙන් පසු ඡන්දදායක භූමිකාව

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පමණක් ඡන්දදායක වගකීම් අවසන් නොවේ. තමන් ඡන්දය සහ මනාපය ලබාදුන් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන් නිවැරිදිව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමසිලිමත් වීම සහ මැතිවරණ සමයේදී ලබාදුන් මැතිවරණ පොරොන්දු ඉටුකිරීම පිලිබඳව සොයා බැලීම සහ ඒ සඳහා පෙළඹවීම් සිදුකිරීමද ඡන්ද දායක වගකීමකි. එය හුදකලාව හෝ සංවිධානාත්මකව සිදුකල හැකිය.
විශේෂයෙන්ම ජනතා අපේක්ෂා පසෙක ලා දේශපාලනය සිය පුද්ගලික ලාභ ප්‍රයෝජනය පිණිස යොදවන්නේ නම් එයට එරෙහි වීමද ඡන්දදායක වගකීමකි.



එසේම සිය ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ගිය මන්ත්‍රීවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියාකාරී වන්නේදැයි විමසිලිමත් විය යුතුය. ඔහු පාර්ලිමේන්තුවට පැමිණීම විවාද සඳහා දක්වා ඇති දායකත්වය. පාර්ලිමේන්තුවේ ජනතා ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටීම්, මහජනතාවගේ පෙත්සම් ඉදිරිපත් කිරීම්, මෙන්ම පාර්ලිමේන්තු කමිටු නියෝජනය පිලිබඳවද සොයා බැලීම අවධියෙන් සිටින ඡන්දදායකයකු විසින් සිදුකල යුත්තකි.

# 6. නිවැරදිව ඡන්දය දීම

ඡන්ද මධ්‍යස්ථානයක ක්‍රියාවලිය සහ එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය පිලිබදව මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලබයි.

## 6.1. ඡන්ද විමසීමේ දිනය

ඡන්ද විමසීමේ දිනය පලමුව නිවේදනය  කිරීමට බලය පවතින්නේ ජනාධිපතිවරයාටය. අදාල දිනයේ ඡන්ද විමසීම් පැවැත්වීමට නොහැකිවන අවස්ථාවකදී වෙනත් දිනයක් නියම කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව පවතී. ඒ අනුව මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද විමසීම් 2020 අගෝස්තු මස 5 වන දින පැවැත්වේ.

## 6.2. ඡන්දවිමසීම පැවැත්වෙන කාල සීමාව

පාර්ලිමේන්තු මැතිවරණ පනත ඇතුලු සෑම මැතිවරණ සහ ඡන්ද විමසීම් පනතකම දක්වන්නේ ඡන්ද විමසීම් දිනයේ පෙරවරු 7 සහ පස්වරු 4 අතර කාලය තුල ඡන්ද විමසීම පැවැත්විය යුතු බවයි.නමුත් මැතිවරණ කොමිෂන් සභාවට ඡන්ද විමසීමේ කාලසීමාව ගැසට් පත්‍රයේ පලකිරීම මගින් වෙනස් කිරීමට බලතල පවතින බවත් මෙම පනත්වලම සදහන් වේ. කෙසේ නමුත් උදැසනම ඡන්දය භාවිතා කිරීම සදහා ඡන්ද මධ්‍යස්ථානය වෙත යාම වඩාත් සුදුසු වේ.

## 6.3. ඡන්දය පොලට  රැගෙන යායුතු දේ

ඡන්ද මධ්‍යස්ධානයට යන විට සෑම ඡන්ද දායකයකු විසින්ම රැගෙන යායුතු ලේඛණ 2ක් ඇත.

1. ඡන්දය භාවිතා කිරීම සදහා පිළිගත් හැදුනුම් පතක්
2. නිළ ඡන්ද දැන්වීම පත්‍රිකාව

එසේම කොවිඩ්-19 වසංගත තත්වය නිසා සෞඛ්‍යය අධ්‍යක්ෂක ජෙනරාල්වරයා ලබාදී ඇති උපදෙස් පරිදි මුව ආවරණයක් සහ පෑනක් රැගෙන යායුතුය.

එයට අමතරව කුඩයක් වැනි අවශ්‍ය දෙයක් හැරුණවිට වෙනත් ගමන්මලු වැනි දැ ඡන්ද පොල වෙත රැගෙන යාමෙන් ඔබත් මැතිවරණ කාර්යය මණ්ඩලයත් අපහසුතාවයට පත් වේ.

## 6.4. ඡන්දය ලබාදීම සදහා පිලිගත් හැදුනුම්පත්

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
3. වලංගු රියදුරු බලපත්‍රය,
4. විශ්‍රාම වැටුප් අධිකෂක ජෙනරාල් /ප්‍රාදේශය ලේකම් විසින් නිකුත්කරන ලද විශ්‍රාමික හැඳුනුම්පත,
5. සමාජ සේවා අධ්‍යක්ෂක ගේ ප්‍රාදේශිය ලේකම් විසින් නිකුකර ඇති වැඩිහිටි හැඳුනුම්පත,
6. පුජ්‍ය/පූජක හැඳුනුම්පත,
7. සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත්කර ඇති තාවකාලික හැඳුනුම් පත්‍රය,
8. පුද්ගලයන් ලියාපදිංචි කිරීම් දෙපාර්තමේන්තුව විසින් එම ඡන්දය වෙනුවෙන් නිකුත්කර ඇති තාවකාලික හැඳුනුම්පත.

මේ හැර වෙනත් හැදුණුම්පත් ඡන්ද මධ්‍යස්ථානයේදී පිළිනොගන්නා බැවින් ඉහත 1සිට 6 දක්වා වන හැදුණුම්පතක් තමා සතුව නොමැති නම් සහ තිබෙන ඒවා අපැහැදිලි නම් අංක 7 හෝ 8 යටතේ විස්තර කර ඇති හැදුණුම් පතක් ලබාගැනීමට කටයුතු කල යුතුය.

## 6.5. ඡන්ද මධ්‍යස්ථානයට ඡන්ද දායකයා ඇතුලුවූ විට සිදුවන ක්‍රියාවලිය

1. ඡන්දදායකයා නිල දැන්වීම් පත්‍රිකාව නිලධාරියට ලබාදුන් පසු ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්ද දායකයාගේ නම සහ අංකය හඬනගා කියවීම.
2. හැදුනුම්පත පරීක්ෂාකර බලා ඡන්ද දායකයාගේ අනන්‍යතාවය තහවුරුකරගත ගැනීම.
3. ඡන්ද පොල නියෝජිතයින්ගේ විරෝධතාවයක් පවතින්නේ නම් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය.
4. ඡන්ද දායකයාගේ අංකය ඡන්ද පත්‍රිකා පොතෙහි උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කිරීම.
5. ඡන්ද පත්‍රිකාව නිල ලකුණින් මුද්‍රා තැබීම.
6. අදාළ ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකාවක් නිකුත්කළ බව දැක්වීම පිණිස ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදීම (මෙහිදී ඡන්ද පත්‍රිකාවේ අංකය නොයෙදිය යුතුයි).
7. ඡන්ද දායකයන් සඳහා වම් සුළැගිල්ලේ නොමැකිය හැකි තීන්ත ලකුණක් යෙදිම.
8. ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දීම.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සදහන් වන මෙම පියවරයන්ට අමතරව කොවිඩ්-19 වසංගත තත්වයක් තුල මෙම මැතිවරණය පවත්වන බැවින් ඡන්ද මධ්‍යස්ථානයට ඇතුලු වන අවස්ථාවේදී සහ ඉන් පිටවන අවස්ථාවේදී විෂබීජ නාශක දියර යොදා ඡන්ද දායකයින්ගේ දැත් පිරිසිදු කිරීම සදහා නිලධාරීන් යොදවා ඇත. එසේම ඡන්ද පොල අසල රැදී සිටීමේදී සමාජ දුරස්ථභාවය තබාගැනීම සදහා ලකුණුකර ඇති සලකුණු වලට අනුකූල වෙමින් රැදී සිටීමද අනිවාර්යෙන්ම කල යුතුය.


## 6.6. ඡන්ද පත්‍රිකාව අතට ලැබුණු පසු

මුලින්ම තමන් කැමති දේශපාලන පක්ෂයට අදාල ලකුණ හෝ ස්වාධින කණ්ඩායම් අංකය ඉදිරියේ ඇති කොටුව තුල කතිර ලකුණ සලකුණු කරන්න. එක හා සමාන සලකුණු ඡන්ද පත්‍රිකාව තුල තිබිය හැකි බැවින් කතිර ලකුණ යෙදීමට පෙර හොදින් පරීක්ෂාකාරී වන්න. එක් ලකුණකට

වඩා වැඩියෙන් ඡන්දය ලබාදෙන ඡන්ද පත්‍රිකා අවලංගු වන බැවින් එක් ලකුණක් ඉදිරියේ පමණක් කතිරය සලකුණු කරන්න. දෙවනුව තමන් කැමති අපේක්ෂයාට අපේක්ෂකයන් දෙදෙනෙකුට හෝ අපේක්ෂකයන් තිදෙනෙකුට අදලා අංක මත කතිර ලකුණ යොදන්න. අංක 3කට වඩා මනාප ලබාදීමෙන් එකී ඡන්ද පත්‍රිකාව මනාප ලකුණු කිරීමේදී සැලකිල්ලට නොගන්නා බැවින් මනාප එකක් දෙකක් හෝ තුනක් පමණක් ලකුණු කිරීමට සිහිතබා ගන්න. ඡන්ද පත්‍රිකාව නමා ඡන්ද පෙට්ටිය තුලට දමන්න.

## 6.7. අතිරේක කරුණු

- අන්ධ භාවය හෝ යම් ශාරීරික ආබාධයක් නිසා ඡන්දය දීමට අපොහොසත් වන අයෙකුට ස්ථානාධිපතිගේ කාර්යය බලය ඇතිව ඡන්ද දායකයාගේ උපදෙස් මත ඡන්දය ලකුණු කර පෙට්ටිය තුළට බහාලිය හැකිය.
- ඡන්දය භාවිතා කිරීමේදී අනවධානය නිසා වැරදීමක් වුව හොත් එය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කර ඔහු සෑහීමකට පත් වුවහොත් නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.
- අදාල ඡන්ද දායකයාගේ ඡන්දය වෙනත් අයෙකු භාවිතා කර ඇති විටක අදාල ඡන්ද දායකයා වෙත ද්විත්ව ඡන්ද පත්‍රිකාවක් ලබා දෙනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකාව වෙනත් වර්ණයකින් යුක්ත අතර එය ලබා දීමට පෙර ප්‍රකාශයකට අත්සන් ගනු ලබයි. එසේම ඔහුගේ නම ද්විත්ව ඡන්ද ලේඛනයට ඇතුළත් කළ යුතුය.



ඇතුළුවීම
IN
01 ඡන්ද දායකයාගේ නම සහ අංකය හඬනගා කියවීම.
02 ඡන්ද දායකයාගේ අනන්‍යතාවය තහවුරුකරගත ගැනීම.
03 ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කිරීම.
04 ඡන්ද පත්‍රිකාව නිල ලකුණින් මුද්‍රා තැබීම.
05 අදාළ ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදීම
06 වම් සුළැඟිල්ලේ නොමැකිය හැකි තීන්ත ලකුණක් යෙදීම.
07 ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දීම.
08 ඡන්දය සලකුනු කිරීම
09 ඡන්ද පත්‍රිකාව නමා ඡන්ද පෙට්ටිය තුලට දැමීම
පිටවීම
OUT

# 7. අපිත් එක්ක එකතු වෙමුද?

## 7.1. පැෆ්රල් සංවිධානය

පැෆ්රෙල් 1987 දී ආරම්භ කරන ලද්දේ ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධාන කිහිපයක නියෝජිතයන් විසිනි. එය සමාගම් පනත යටතේ ලාභ නොලබන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර ඇත.පැෆ්රල් පිහිටුවන ලද්දේ ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් හේතුවෙන් තරඟයේ සම අවස්ථාවන්ට බලපෑම් එල්ල වන බැවින් මැතිවරණවල ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය සහතික කිරීම සඳහා සිවිල් සමාජයට මැදිහත් වීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති අවස්ථාවක ය.

පැෆ්රෙල් පිහිටුවීමේ එක් ප්‍රධාන අරමුණක් වූයේ මැතිවරණයට පෙර, පසුව සහ පසුව ප්‍රචණ්ඩත්වය සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා ජනතාවගේ උත්සාහය ප්‍රවර්ධනය කිරීමයි. පැෆ්රෙල් පිහිටුවීමෙන් පසු රටේ පැවැත්වෙන සියළුම මැතිවරණ සිවිල් සමාජ සංවිධාන විශාල සංඛ්‍යාවක් සමඟ සහයෝගයෙන් නිරීක්ෂණය කර ඇත. එය වසර ගණනාවක් පුරා රටේ විවිධ ප්‍රදේශවල ඡන්ද දායකයින්ගේ අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ යහපාලනය වැනි ක්ෂේත්‍රවල උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. පැෆ්රල් සිය සියලු ක්‍රියාකාරකම් වලදී පූර්ණ මධ්‍යස්ථභාවය පවත්වා ගෙන යයි.

## 7.2. දැක්ම

දේශපාලනික සාක්ෂරතාවයෙන් යුත් සහ බලගතු පුරවැසියෙකු සමඟ ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම අගය කරන සහ පාලනයේ වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ප්‍රජාතන්ත්‍රවාදී ජාතියක් පෝෂණය කිරීම.

## 7.3. මෙහෙවර

හෘද සාක්ෂියට එකඟව පුරවැසියෙකුගේ ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම සහ සියලු නිදහස් හා සාධාරණ මැතිවරණ

ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීම සහ යහපාලනය ආරක්ෂා කිරීම සඳහා උපකාරී වන ගතික සිවිල් සමාජයක්.

## 7.4. පැෆ්රල් සංවිධානයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

පැෆ්රල් සංවිධානයේ සිවිල් ක්‍රියාකාරකම් අතර පහත සදහන් කටයුතු ඉතා ප්‍රමුඛ වේ. එනම්

- මැතිවරණ නිරීක්ෂණය
- ඡන්දදායකයන් දැනුවත් කිරීම
- ඡන්ද නාම ලේඛණ ප්‍රතිශෝධන ක්‍රියාවලියට පහසුකරණය
- මාර්තු 12 ව්‍යාපාරය හා සම්බන්ධ දිස්ත්‍රික් දැනුවත් කිරීම
- මාර්තු 12 ව්‍යපාරයට අනුයුක්ත පාර්ලිමේන්තු සංසදය හා සබැදි ක්‍රියාකාරකම්

## 7.5. පැෆ්රල් සංවිධානය සමග ඔබට සම්බන්ධවිය හැකි ආකාරය

- දිගුකාලින මැතිවරණ නිරීක්ෂකයකු ලෙස
- ජංගම මැතිවරණ නිරීක්ෂකයකු ලෙස
- මැතිවරණ නිරීක්ෂණ කාර්යය මණ්ඩල සාමාජිකයකු ලෙස
- දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණයෙන්